# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## **බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත** සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 මාර්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 මාර්තු මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[247 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තියට ඉක්බිතිව ම 4අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ගෙවීම පැහැර හැර ඇත්තේ යම් ණය මුදලක් සම්බන්ධයෙන් ද එම ණය මුදල සඳහා ඇපය වශයෙන් බැංකුව වෙත උකස් කරනු ලැබ ඇති යම් දේපළක් 4අ වගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට 2024 දෙසැම්බර් මස 15 දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම අත්හිටුවීම වේ.

## බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

එල්.ඩී.-ඕ. 17/2024

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2024 අංක      දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1990 අංක 4 දරන පනතට 4අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

**2.** 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම පනතේ 4අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුත්තේ ය:-

"යම් දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම තාවකාලිකව අත්හිටුවීම

4අ. 3 වන වගන්තියේ අතුරු විධානයේ සහ 4 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොතකා, ගෙවීම පැහැර හැර ඇති යම් ණය මුදලක් සඳහා ඇපය වශයෙන් බැංකුව වෙත උකස් කරනු ලැබ ඇති යම් දේපළක් මේ වගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට 2024 දෙසැම්බර් මස 15 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා මණ්ඩලය විසින් කිසිදු තැනැත්තකු වෙත බලය ලබා නොදිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.